අවුරුදු දෙදහස් පන්සියයකට අධික ලිඛිත ඉතිහාසයක් සහිත යුගයකට අයත් අමිල පුරාවස්තු මෙන්ම තවත් අවුරුදු දහස් ගණනක් ඉන් ඔබ්බට දිවයන පූර්ව ඓතිහාසික යුගයට අයත් පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික සාධකද අවුරුදු එක් ලක්ෂ විසිපන්දහසක් එහාට දිවයන අතීතයට අයත් පුරාවස්තුද ඇතුලත් මානව පරිණාමයේ විශේෂ අවස්ථාවන්ද හමුවන අප රටේ පුරාවස්තු මානව ඉතිහාසයේ සුවිශේෂී ස්ථානයක් ගනියි.



මෑත අතීතයට අයත් කෞතුක භාණ්ඩ වන වැදගත් ලේඛන, කලාකෘති, ගෘහ භාණ්ඩ, පැරණි රෙදිපිළි මෙන්ම ඉපැරණි බුදු පිළිම, පුස්කොළපොත්, පැරණි කාසි වර්ග, ස්වර්ණාභරණ, ගල් කැටයම්, ඇත්දළ සහ කලුවර කැටයම්, ලී කැටයම්, මැටි සහ පිගන් භාණ්ඩ, පිත්තල සහ ලෝකඩ කැටයම්, මූර්ති ආදි විවිධ ස්වරූපයේ පුරාවස්තු සහ ජාතික ලේඛන මෙරටින් හොර රහසේ පිටමං කිරීමට උත්සාහ දැරීමේ දී

**රේගුව මගින් අත්අඩංගුවට ගෙන තිබේ.**



ඉපැරණි
ධාතු කරඬුවක්

අද විවිධ රටවල, විශේෂයෙන්ම ආර්ථික අතින් පොහොසත් රටවල ඇතිවී තිබෙන වෙළඳපොල මෙම භාණ්ඩ මෙරටින් පිටකිරීමේ අධික ඉල්ලුමට හේතුවී තිබේ.

ලොව ජාතීන් අතර
අභිමානයෙන් යුතුව
අපට ප්‍රකාශ කළ
හැකි ප්‍රධානතම
කරුණ වන්නේ
ප්‍රෞඪ ඉතිහාසයකට
හිමිකම් කියන
අපේ උරුමයයි.

අධිරාජ්‍යවාදී යුගයේ මහා පරිමාණයෙන් සිදුවූ පුරාවස්තු සහ සංස්කෘතික දේපල කොල්ලය අද දවසේද සිදුවන්නේ අපේ සම්පත්වල අගය ගැන අවබෝධයක් නැති, අපේ සංස්කෘතිය ගැන හැඟීමක් නැති 'අපේකම' නොමැති, මුදල් සෙවීම ඒකායන අරමුණ කරගත් අපේම සමහර උදවිය නිසා බව අවබෝධ කරගත යුතුය.



කෞතුක වටිනාකමක්
ඇති ලෝකඩ ප්‍රතිමාවක්



ඉපැරණි පුස්කොළ පොත්

එසේම මුදලට යටවී අපේ උරුමය විනාශ කර දැමීමේ කොන්ත්‍රාත්තුව භාරගත් පිරිස් මේ පිටුපස සිටින බව අප කවුරුත් දැන සිටිය යුතුය. එම නිසා අපගේ සංස්කෘතික උරුමය රැක ගැනීමට අප හා එක්වන්න. එය ජාතික මෙහෙවරකි.



රිදී කැටයම්
සහිත ඇත්දළ



නුවර යුගයට
අයත් ඇත් දළ
කැටයම් සහිත
ගිරය සහ
පන්හිඳ කට්ටලය.



ඉපැරණි පිගන් භාණ්ඩ